# <u>නිවේදනය</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද **"2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන)"** නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

**ත්‍රිපුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් විසින් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තීරණය ලබාදී ඇති අතර විනිසුරුවරුන් දෙදෙනෙකුගේ තීරණය පහත පරිදි වේ:-**

1. පනත් කෙටුම්පතෙහි 2, 3, 4, 6, 7, සහ 10 වගන්ති සමඟ කියවිය යුතු 12 වැනි වගන්තියේ "කොවිඩ් 19 සම්බන්ධිත තත්ත්වය" සම්බන්ධයෙන්වූ අර්ථ නිරූපණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4(ඇ) ව්‍යවස්ථාවන් සමඟ අනනුකූල වන බැවින් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) වැනි ව්‍යවස්ථාවට අනුව විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීමට සහ ජනමත විචාරණයකදී අනුමත කිරීමට අවශ්‍යවේ.

   එසේ වුවද, 12 වැනි වගන්තියේ "කොවිඩ් 19 සම්බන්ධිත තත්ත්වය" සම්බන්ධයෙන්වූ අර්ථ නිරූපණය මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් කර ඇති පරිදි සංශෝධනය කළහොත් එම අනනුකූලතාවය ඉවත්ව යනු ඇති බැවින්, පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කළ හැකිය.

2. පනත් කෙටුම්පතේ 4 වැනි වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4(ඇ) ව්‍යවස්ථාව සමඟ අනනුකූල වන බැවින් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) වැනි ව්‍යවස්ථාවට අනුව විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීමට අවශ්‍යවේ.

ශ්‍රේෂ්ඨාධිකරණ වෙත ඉදිරිපත් කර ඇති යෝජිත සංශෝධනයට අනුව අදාළ සංශෝධන සිදු කරන්නේ නම් ඉහත වගන්තියේ එම අනනුකූලතාවය ඉවත්ව යනු ඇති බැවින්, පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කළ හැකිය.

3. පනත් කෙටුම්පතේ 5, 6 සහ 7 වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව සමඟ අනනුකූල වන බැවින් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) වැනි ව්‍යවස්ථාවට අනුව විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීම අවශ්‍යවේ.

4. පනත් කෙටුම්පතේ අනෙකුත් වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බැවින් ඒවා පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කළ හැකි බවත් කෙසේ වුවද පනත් කෙටුම්පතෙහි 3(1) වගන්තිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය අදහස් කර ඇති ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු වේ.

**අනෙක් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයාගේ තීරණය පහත පරිදි වේ:-**

1. ඉහත පනත් කෙටුම්පතේ 2, 3, 4, 6, 7, 8, 9 සහ 10 වගන්ති සමඟ කියවිය යුතු 12 වැනි වගන්තියේ "කොවිඩ් 19 සම්බන්ධිත තත්ත්වය" සම්බන්ධයෙන්වූ අර්ථ නිරූපණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4(ඇ) සමඟ අනුකූල වන බැවින් ඒවා පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කළ හැකිය.

කෙසේ වුවද, "කොවිඩ් 19 සම්බන්ධිත තත්ත්වය" සම්බන්ධයෙන්වූ අර්ථ නිරූපණයෙහි (ආ) උප වගන්තිය එහිම (ඇ) උප වගන්තියට උදාහරණයක් වීම යන කරුණ සැළකීමෙන් "කොවිඩ් 19 සම්බන්ධිත තත්ත්වය" සම්බන්ධයෙන් වූ අර්ථ නිරූපණයෙහි සංශෝධනයන් සිදු කළ යුතු ය.

2. පනත් කෙටුම්පතේ 4 වැනි වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4(ඇ) ව්‍යවස්ථාව සමඟ අනනුකූල වන බැවින් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) වැනි ව්‍යවස්ථාවට අනුව විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීමට අවශ්‍ය වන බව සහ ශ්‍රේෂ්ඨාධිකරණ වෙත ඉදිරිපත් කර ඇති යෝජිත සංශෝධනයට අනුව අදාළ සංශෝධන සිදු කරන්නේ නම් ඉහත වගන්තියේ එම අනනුකූලතාවය ඉවත්ව යනු ඇති බැවින්, පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කළ හැකිය.

3. පනත් කෙටුම්පතේ 5, 6, 7 සහ 8 වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථා සමඟ අනුකූල වන බැවින් පාර්ලිමේන්තුවේ සරල බහුතර ඡන්දයෙන් සම්මත කළ හැකිය.

4. පනත් කෙටුම්පතේ අනෙකුත් වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බැවින් ඒවා පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කළ හැකිය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යයි නියෝග කරමි.